ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

## <u>මහ කොමසාරිස්තුමාගේ මහනුවර සංචාරය ඉන්දියා - ශ්‍රී ලංකා සබඳතාහි පෘථුලත්වය අවධාරණය කරයි</u>

ඉන්දියානු මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා 2024 ජනවාරි 18 වන දින මහනුවර සංචාරයක නිරත විය.

2. මහ කොමසාරිස්තුමා අස්ගිරි පාර්ශවයේ මහා නායක අති පූජ්‍ය වරකාගොඩ ශ්‍රී ඥානරතන මහා නා හිමියන් සහ මල්වතු පාර්ශවයේ මහා නායක අති පූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහ නා හිමියන් බැහැදැක ආශිර්වාද ලබා ගත්තේය. එහිදී එතුමා ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ජනතාව අතර පවතින ඉපැරණි සම්බන්ධය සඳහා බුදු දහම කේන්ද්‍රීය වූ බව සඳහන් කළ අතර ද්විපාර්ශවික බොදු බැඳීම් ශක්තිමත් කිරීම සඳහා ඉන්දීය රජය විසින් ගෙන ඇති විවිධ පියවර පිළිබඳව මහා නාහිමිවරුන් දැනුවත් කළේය. ඉන්දීය රජයේ ආධාර යටතේ දිවයින පුරා විහාරස්ථාන කඩිනමින් සූර්ය බලයෙන් බලගැන්වීම සඳහා ගෙන ඇති පියවර පිළිබඳව මහ කොමසාරිස්තුමා විශේෂයෙන් මෙහිදී සඳහන් කළේය.

3. මහනුවර ශ්‍රී දළදා මාලිගාව වැඳ පුදා ගත් එතුමා දෙරට ජනතාවගේ සෞභාග්‍යය සහ සුබසිද්ධිය සඳහා මෙන්ම ඔවුන් අතර වඩා ශක්තිමත් සහ ගැඹුරු සබඳතා සඳහා ප්‍රාර්ථනා කළේය.

4. කතරගම දේවාලය ද වැඳ පුදාගත් එතුමා ද්විපාර්ශවික සබඳතා තවදුරටත් විවිධාංගීකරණය වී වඩා ශක්තිමත් වේවා යැයි ප්‍රාර්ථනා කළේය.

5. හන්තාන වතුයායේ සංචාරයක නිරත වූ මහ කොමසාරිස්තුමා එහි ක්‍රියාත්මක ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ ප්‍රගතිය නිරීක්ෂණය කළේය. ඉන්දීය රජය තෙවන අදියර යටතේ දැනටමත් නිවාස 50ක් එම වතුයායේ

ඉදිකර ඇති අතර ඊළඟ අදියර යටතේ තවත් නිවාස රැසක් ඉදිවෙමින් පවතී. සමස්තයක් ලෙස ඉන්දීය රජය මෙම ව්‍යාපෘතියේ තෙවන සහ සිව්වන අදියර දෙක යටතේ වතු කම්කරුවන් සඳහා නිවාස 14,000ක් ඉදි කරනු ලබයි.

6. මහ කොමසාරිස්තුමා ආයුර්වේද කඳවුරක් ද විවෘත කළ අතර එහි අරමුණ වූයේ වතු කම්කරුවන්ගේ කායික සුබසිද්ධිය ඉහළ නැංවීමයි. මහ කොමසාරිස්තුමා විසින් වතුයායේ පාසල් දරුවන් සඳහා අධ්‍යයන ද්‍රව්‍ය සහ කුඩ ද මෙහිදී බෙදා දෙන ලදී. මෙම සියලු කටයුතු වතු කම්කරුවන්ගේ, විශේෂයෙන්ම ඉන්දීය සම්භවයක් ඇති දමිළ ප්‍රජාවගේ, සමස්ත ජීවන තත්වය වැඩි දියුණු කිරීමට ඉන්දීය රජයේ දැඩි කැපවීම අනුව ක්‍රියාවට නැංවෙන බව මහ කොමසාරිස්තුමා සඳහන් කළේය.

7. ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් 2023 ජූලි මාසයේ දී සිදු කරන ලද ඉන්දීය සංචාරය අතරතුර ඉන්දියානු රජය විවිධ ක්ෂේත්‍ර සඳහා ශ්‍රී ලංකා රුපියල් බිලියන 3ක ප්‍රදාන පැකේජයක් ද ප්‍රකාශයට පත් කළේය.

***

***කොළඹ***
***2024 ජනවාරි 19***